# මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා හා පශ්චාත් උපාධි ආයතනය (PGIHS)

# පේරාදෙණිය විශ්වවිද්‍යාලය

## අධ්‍යක්ෂ තනතුර සඳහා අයදුම්පත් කැඳවීමයි

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ (PGIHS) අධ්‍යක්ෂ තනතුර පිරවීම සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩලය වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ. PGIHS ආයතනය යනු, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24 A වගන්තිය යටතේ උසස් අධ්‍යයන අමාත්‍යාංශය විසින් ආඥා පනතක් මගින් පිහිටුවන ලද, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා ක්ෂේත්‍රයේ උසස් අධ්‍යාපනය ලබාදීම ප්‍රවර්ධනය හා සංවර්ධනය උදෙසා පිහිටුවන ලද ජාතික ආයතනයකි. අයදුම්කරු අදාළ ආයතන ආඥාපනත යටතේ, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ස්ථිර සාමාජිකයෙකු විය යුතුය.

PGIHS ආඥාපනත ප්‍රකාරව අධ්‍යක්ෂවරයා, ආයතනයේ ප්‍රධාන විධායක, ප්‍රධාන අධ්‍යයන හා ගිණුම්කරණ නිලධාරීවරයා වේ. අධ්‍යක්ෂවරයා, පාලක සභාවේ සභාපතිවරයා මෙන්ම ආයතනයේ එක් එක් අධ්‍යයන මණ්ඩලයක නිල බලයෙන් සාමාජිකයෙකු වේ. පත් කරනු ලබන අධ්‍යක්ෂවරයා එම තනතුර පත් කරනු ලබන දින සිට වසර තුනක කාලයක් හෝ ඔහු / ඇය වයස අවුරුදු 65 සම්පූර්ණ වීම දක්වා දරනු ලබන අතර, මෙම කරුණු දෙකින් එකක් මුලින් සිදුවීම මත කාලය අවසන් වීම බලපැවැත්වේ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛ අංක 10/2022 අනුව අයදුම්කරු වයස අවුරුදු 63 ට වඩා අඩු ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

ආයතනයේ දැක්ම වනුයේ, පශ්චාත් උපාධි අධ්‍යයනය, පර්යේෂණ හා රටෙහි මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පර්යේෂණ හා විද්වත් චින්තන ක්ෂේත්‍රයන්හි ප්‍රමුඛයා වීම සේම, කලාපයේ විශිෂ්ඨයන්ගේ මධ්‍යස්ථානය බවට පත්වීම වේ. පිළිගත් ආයතනික සැලැස්ම යටතේ, ආයතනය නව ඉල්ලුමට සරිලන බහු විෂය අධ්‍යයන වැඩසටහන් හඳුන්වාදෙමින් හා පර්යේෂණ හා ප්‍රජා සම්පතාවය මත ක්‍රියාකාරී සහාගීත්වය හරහා තම අධ්‍යයන වැඩසටහන් හා පර්යේෂණ ආයෝජන ව්‍යාප්ත කිරීම සඳහා සැලසුම් කරයි. ඒ අනුව, PGIHS ආයතනයේ පාලක මණ්ඩලය ඉතා ඉහළ අධ්‍යයන පසුබිමක් සහිත හා පර්යේෂණ හා කළමනාකරණ ක්ෂේත්‍රයේ විශිෂ්ඨ වාර්තා තබා ඇති ආයතනයේ දැක්ම සාක්ෂාත් කළ හැකි පුද්ගලයෙකු අධ්‍යක්ෂවරයා වශයෙන් පත්වීම අපේක්ෂා කරයි.

අපේක්ෂිත අයදුම්කරු සතුව, පශ්චාත් උපාධි සුදුසුකම් විශේෂයෙන් ආචාර්ය උපාධි (Ph.D) සුදුසුකම් තිබීම හා පරිපාලන දැනුම පැවතීම අපේක්ෂා කෙරේ. එසේම, ඔහු / ඇය සතුව, බහු විෂය ක්ෂේත්‍රයේ අධ්‍යයන පරිසරයක රාජකාරී කිරීමට අවශ්‍ය අන්තර් පුද්ගල කුසලතා තිබිය යුතු අතර, ඒ සමග ප්‍රජාව කෙරෙහි ආයතනයේ බැඳීම වටහාගත් අයකු විය යුතුය. සාර්ථක අයදුම්කරු අධ්‍යයන නායකත්වය සැපයීමේ වගකීම දරනු ලබන අතර, විශ්වවිද්‍යාලය තුළ පවත්නා වෙනත් සංවිධාන හා අනෙකුත් ජාතික හා ජාත්‍යන්තර ආයතන සමග ක්‍රියාකාරී සබඳතාවයන් ස්ථාපිත කරගත යුතුය.

අධ්‍යක්ෂවරයා U-AC5 (II) පරිමාණයේ වැටුපක් ලබාගැනීම සඳහා සුදුසුකම් ලබන අතර, එයට අමතරව ස්ථිර මාසික සංග්‍රහ දීමනාවක්, විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩයට අදාළ අධ්‍යයන දීමනාවක්, නිල ප්‍රවාහන පහසුකම් හා අනෙකුත් රජයේ අනුමත තනතුරට අදාළ දීමනාද හිමි වේ.

අපේක්ෂිත අයදුම්කරු විසින්, උපන් දිනය, ආයතනයේ දියුණුවට යෝජනා කරනු ලබන දැක්ම පිළිබඳ ප්‍රකාශයක් හා තනතුරට පත්කරනු ලැබුව හොත් ඔහු / ඇය විසින් ඉටුකිරීමට අපේක්ෂිත කටයුතු පිළිබඳව කෙටි විස්තරයක් සහිතව තමන්ගේ සම්පූර්ණ ජීවදත්ත ඇතුළත් අයදුම්පතක් ලැබීමට සැලැස්විය යුතුය. අදාළ අයදුම්පත පුද්ගලිකව ගෙනැවිත් භාරදීමෙන් හෝ ලියාපදිංචි තැපැල් මගින් එවීමෙන් 2023 දෙසැම්බර් 17 වන දිනට පෙර ලැබෙන සේ සහකාර ලේඛකාධිකාරී මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පේරාදෙණිය යන ලිපිනයට එවිය යුතුය. අදාළ කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂ තනතුර"** යනුවෙන් සඳහන් කළ යුතුය.

අවශ්‍ය වැඩිදුර විස්තර දුරකථන අංක 081-2388957 මගින් හා ඊමේල් ar@pgihs.ac.lk වෙතින් හෝ ආයතනයේ වෙබ් අඩවිය වන www.pgihs.ac.lk වෙතින්, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ සහකාර ලේඛකාධිකාරී වෙතින් ලබා ගත හැකිය.

**සහකාර ලේඛකාධිකාරී,**
**මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය,**
**පේරාදෙණිය විශ්වවිද්‍යාලය.**

**2023 නොවැම්බර් 13**